සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ර/ ඇඹි/ උඩවලව මහා විද්‍යාලය

| | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය - සිංහල | නෙවන වාරය | තිස් එක් වන සතිය |

17 පාඩම පරාස්ස (දෙවන කොටස)

අපට ගුවන් විදුලි නාට්‍ය ,රූපවාහිනී නාට්‍ය වේදිකා නාට්‍ය, වීදි නාට්‍ය ආදි වශයෙන් විවිධ නාට්‍ය රස විඳින්නට අවස්ථාව ලැබේ.මෙවැනි නාට්‍ය බිහි කිරීම තනි පුද්ගලයෙකුගේ පරිශ්‍රමයක ප්‍රතිඵලයක් නොවේ. ඒ සඳහා නාට්‍ය රචකයා, නාට්‍ය නිෂ්පාදකයා, නළු නිළියන්, පසුතල නිර්මාණ ශිල්පීන් ආදී විවිධ පුද්ගලයින්ගේ සහයෝගය අවශ්‍ය වේ. ජන කතා, ජාතක කතා, සුරංගනා කතා හෝ නාට්‍ය රචකයාගේ පරිකල්පනය මෙහෙයවා නිර්මාණය කළ කතාවක් වුවද නාට්‍යයට පදනම් කර ගත හැකි ය.

- **නාට්‍ය පිටපතක් රචනා කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු**

1) නාට්‍ය පිටපත් රචනයේ දී ප්‍රස්තුත චරිත චම්පස කෙළවර දැක්විය යුතුය.

2) චරිත නාමයට පසුව තිත් දෙකක් යෙදිය යුතුය ඉන් අනතුරුව සංවාදය ආරම්භය විය යුතුය.

3) නළු නිළියන්ට රංගනයේ දී අවශ්‍ය උපදෙස් හෙවත් රංග විධාන ඒ ඒ අවස්ථාවේ සංවාද යටින් වරහන් තුළ සටහන් කළ යුතුය.

4) සම්පූර්ණ කතාව නාට්‍යයකින් ඉදිරිපත් නිරීම අපහසු පැවින් නාට්‍යමය අවස්ථා පමණක් තෝරා ගත යුතුය.

5) ප්‍රාණවත් දෙබස් නාට්‍යය සඳහා යොදා ගත යුතු අතර දෙබස් උචිත පරිදි කෙටි විය යුතුය..

6) නාට්‍යයේ භාෂාව නළු නිළියන්ගේ අංග චලන මුහුණේ ඉරියව් ඇඳුම් පැළඳුම් වේදිකා සැරසිලි යෝග්‍ය පරිදි යොදා ගත යුතුය.

- ඔබ කැමති තේමාවක් යටතේ කතා වස්තුවක් තෝරාගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.